# මොට්ටප්පිලි හා බිතු සිතුවම්

මංජුශ්‍රී

නුවර යුගයට අයත් බිතු සිතුවම් අතර විශෙෂ ස්ථානයක් දෙගල්දෙරුවේ සිතියමට ලැබේ. එක් අතකින් මෙය එකල සිටි ශ්‍රෙෂ්ඨ සිත්තරු කීපදෙනකුන් විසින් ඇඳි නිසාත් අනික් අතින් රාජාධිරාජසිංහ රජතුමාගේ සහ මොරතොට ධම්මක්ඛන්ධ මහානායක මාහිමියන්ගේ පරීක්ෂණය යටතේ නිමවූ දෙයක් නිසාත් ඉතා වැදගත් ය. නුවර රාජධානිය පිළිබඳ අවසාන කාලපරිච්ඡෙදයේ සමාජය පිළිබඳ තොරතුරු රාශියක් මේ සිතුවම් වලින් අපට අවබොධ කරගත හැක. රජවරුන්ගේ හා බිසෝවරුන්ගේ ඇඳුම් පැලඳුම් ගැන මෙන් ම අදිකාරම්වරුන්ගේ සිට ඒ ඒ පංතිවලට අයත් අනිකුත් බොහෝ දෙනකුගේ ඇඳුම් පැලඳුම් ගැන ද දෙගල්දෙරු සිතුවම අපට දීර්ඝ විස්තරයක් සපයයි. දෙගල්දෙරුවේ මොට්ටප්පිලි ඇඳුම මෙයින් විශෙෂ එකකි. වෙස්සන්තර රජු තපසට යන්ට සමුගන්නා තැන මොට්ටප්පිලියෙන් මුහුණ පමණක් පෙන්වා සර්වාංගය වසා පෙරෙවි රාජකුමාරියන් දෙදෙනකුගේ රූප වෙති. නුවර යුගයට ඉහත කළ දනට ලැබෙන පුරාණ බිතු සිතුවමක මොට්ටප්පිලි ලාගත් ස්ත්‍රී රූපයක් දකගැනීම දුෂ්කරය.

මොට්ටප්පිලිය ඉහත කාලයේ උසස් පංතිවල කාන්තාවන්ට මෙන්ම ඇතොවුරන් අතර ද ප්‍රචලිතව තිබූ එකකි. නුවර යුගයේ දී නැවතත් එය භාවිතයට ආයේ කෙසේ දැයි සෙවිය යුතුය.

මොට්ටප්පිලිය බුද්ධකාලයේ ද තිබුණු බව විනය නීතියෙන් පෙනේ. ''යථා ච අන්තෙපුරිකායෝ අක්ඛිතාරක මත්තං දස්සෙන්වාංගුණ්ඨිකං පාරු පන්ති — යම්සේ බිසෝ පුරයේ ස්ත්‍රීහු සර්වාංගය වසා කලු ඉංගිරියාවන් පමණක් පෙන්වා සළු හඳිත් ද'' යන බුදුගොස් හිමියන්ගේ පාඨයෙන් එය එකල භාවිත වූ සැටියක් කියයි.

රජදරුවන් සිටුවරයන් වැනි ඉහළ පෙලේ ප්‍රධාන අයගේ පරිචාරිකා ස්ත්‍රීන් ආරක්ෂා සහිතව තැබූ ස්ථාන සංස්කෘත සාහිත්‍යයෙහි අවරොධ යන නමින් හා පාලියෙහි ධරොධ නමින් කියැවෙති. බාහිර සමාජයෙන් තුරන් කොට අභ්‍යන්තරයෙහි ම තබා ගැනීම හෙතුවෙන් මීට අන්තඃපුරයයි ද ව්‍යවහාර වේ. එසේ සාමාන්‍යයෙන් ස්ත්‍රීන් වසන ඇතුල් ගෙයට ද අන්තඃපුරයයි කියති. පිටත ජනයා විසින් දැකිය නොහැකි අන්තඃපුරිකාවෝ අසූර්යං පශ්‍යාවෝ හෙවත් සූර්යයා විසිනුත් නොදැකිය හැක්කෝ යයි ගණන් ගනිති. වචනාර්ථය එසේ වුවත් ගෞණාර්ථයෙන් අන්තඃපුරිකාවෝ සූර්යයාට පවා නොපෙනෙන ලෙස රැකවරණයට භාජන වූවෝ යන අදහස ලැබේ. රාජදරිකා වැනි අන්තඃපුරිකාවන්ට මෙන්ම සාමාන්‍ය උසස් පෙලේ ස්ත්‍රී ජනයාටත් මොට්ටප්පිලි හෙවත් අවගුණ්ඨනය අවශ්‍ය වූයේ තමා නොකැමැති අය ගෙන් රැකවරණ පිණිසය.

ශාකුන්තලයේ කියැවෙන හැටියට දුෂ්‍යන්ත රජු මුවා පසු පස්සේ තපො වනයට ගිය විට ඔහුට ශකුන්තලාව දකින්ට ලැබුණේ හිස වසා පෙරෙවි අවගුණ්ඨනයෙනි.

මුස්ලිම්වරුන් විසින් 'පර්ද' කියන අවගුණ්ඨන චාරිත්‍රය ඉන්දියාවට පුරුදු කරන ලදැයි සැලකීම පිළිගත නොහැක.

''තත්‍ර බල්වපි ගොපා ශාක්‍යකන්‍යා කුචිත් වදනං ඡාදයති ස්ව ස්වශ්‍රූං වා ස්වශුරංවා අන්තර්ජනං වා'' යනාදි වශයෙන් ගොපා හෙවත් යසෝදරා දේවී සිදුහත් කුමරු අභිනික්මන් කළාට පසු නැදි-මයිල් ආදි වැඩිහිටියන් දකත් මුහුණ වසා පොරවා නොගැනීම ගැන ඇයට ඔව්හු දෙස් කීහ. සිත සුරක්ෂිත කොට ඉන්ද්‍රිය සංයත කොට සිටින්නන්ට අවගුණ්ඨනයෙන් වැඩක් නැති බව කීහයි ලලිත විස්තරයෙහි ලැබේ.



දෙගල්දෙරුවේ බිතු සිතුවමට වර්ෂ 19 යකට පසුව කළ තෙල්වත්තේරත්පත් විහාරයෙහි මොට්ටප්පිලි ලාගන්නේ රාජදරිකාවන් පමණක් නොවේ. නානා තත්වවලට අයත් ස්ත්‍රීහුත් එය අඳිති. රැකව, මුකිරිගල, ඇල්ගිරිය, පාතේගම, දෙඩංදූව, මලල්ගොඩ, ඔළුල්පේ යනාදි නුවර යුගයට හා ඊට ආසන්න මැතක විහාර බිතු සිතුවමේ මේ මොට්ටප්පිලි ඇඳුම සුලභ ය. තෙල්වත්තේ මෙන්ම තවත් නොයෙක් තැන්වල විහාරවල බිතු සිතුවමෙ මොට්ටප්පිලි යෙදීම මිනිස් ස්ත්‍රීන්ට පමණක් සීමාවූවක් නොවේ. පංචකාම සුවයෙන් ප්‍රීතිවිනොදය උත්කර්ෂයෙන් අනුභොග කරන නිර්මාණරති දිව්‍යලොකයෙහි අප්සරාවන්ට ද මොට්ටප්පිලි දී තිබේ.

ඉන්දියන් කාන්තා පක්ෂය මොට්ටප්පිලිය ප්‍රියකරයි. විධවා ස්ත්‍රීන් ට මෙය විශෙෂ ලක්ෂණයකි.

